සන්නස SANNASA

## ලියා දන්වන වග

**සන්නස පුවත්පත අනෙකුත් පුවත් පත් වලින් වෙනස් වනුයේ එයින් ඔබට ලබා දෙන දැනුම විනෝදය ප්‍රබෝධය එය ප්‍රකාශයට පත් වන කාලයට පමණක් සීමා නොවන නිසාය. සන්නස ඔබේ පෞද්ගලික පුස්තකාලයේ තබාගෙන වසරේ ඕනෑම කාලයක කියවිය හැකි රසවිඳිය හැකි ප්‍රකාශනයක් බව අප හිතවත් පාඨකයෝ අප වෙත දන්වා එවා ඇත.මෙය කියැවූ ශ්‍රී ලංකාවේ විද්වතුන් කිහිප පොළක්ම පැවසුවේ ලංකාවේ පළවන ප්‍රකාශන අතර තැබුවත් සන්නස ඉදිරියෙන් සිටින බවයි.**

**මේ තරම් ඉහල ගුණාත්මක භාවයෙන් යුතුව සන්නස පවත්වාගෙන යාම සඳහා දායක වූ අපට ලිපි සපයන මහත්ම මහත්මීනුත් දැන්වීම් ලබාදෙමින් සන්නසට ජීවනාලිය දුන් අපගේ අනුග්‍රාහක භවතුනුත් සන්නස කියවා ගුණ දොස් අප වෙත දන්වා එවන සහෘදයනුත් දිවා රාත්‍රී නොබලා වෙහෙසෙන අපගේ කාර්‍ය මණ්ඩලයටත් විශේෂයෙන් අපගේ පාඨක ජනතාවටත් අපේ ගෞරව ප්‍රණාමය පුද කර සිටිමු. ලැබුවාවූ 2020 වසර ඔබ සියලු දෙනාටත් ඔස්ට්‍රේලියානු හා ශ්‍රී ලාංකික ජනතාවටත් සාමය සතුට සෞභාග්‍ය සපිරේවා යයි සන්නස වෙනුවෙන් ක්‍රිස්ටල් ඩී ඩිජිටල් ගෘප් සහ සන්නස මීඩියා ගෘප් අධිපති ඩිලාන් ජයතිලක හා කාර්ය මණ්ඩලය ප්‍රාර්ථනා කරනු ලබයි.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක **/ Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්‍ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්
ප්‍රසාද් විජයබන්දු

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්‍ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Prasad : 0413 201 590**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# ආලින්දය



අද ආලින්දයට කැඳවාගෙන එන්නේ ශ්‍රී ලංකාවේ හය වන ජනාධිපති

## මෛත්‍රීපාල සිරිසේන මහතා

**ප්‍රශ්නය : ඉතින් කොහොමද හිටපු ජනාධිපතිතුමා... හිටපු කියන යෙදුම ඇසෙන විට ඔබට හිතට අමාරුවක් වගේ, ශෝකයක් වගේ හැඟීමක් ඇතිවෙනවා ඇති නේද...?**

පිළිතුර : මම පරාජයට පත්වෙලා, හිටපු කියන තැනට ආවේ නැහැ. අනිත් එක දේශපාලනයේ පරාජය කියන එකත් මට හොඳට පුරුදුයි. මම පුද්ගලයෙක් විදිහට පරාජයට පත් වෙලා නැති වුණත් අපි පක්ෂයක් විදිහට පරාජයන් ගණනාවක් ලබලා තියෙනවා. 1977 සිට අපි ශ්‍රී.ල.නි.ප.ය ලෙස පරාජයට පත්වෙන කොට මම පක්ෂයේ සංවිධායකවරයෙක්. ඒ නිසා බලය පිළිබඳව, බලය නැතිවීම පිළිබඳව ඒ තරම් මගේ තැකීමක් නැහැ.

**ප්‍රශ්නය : පසුගිය ජනාධිපතිවරණයේදී ඔබ කටයුතු කළේ නිර්පාක්ෂික තත්ත්වයෙන්. සමහරු චෝදනා කරන්නේ ඔබ එම ජනාධිපතිවරණයේදී සජිත් ප්‍රේමදාස මහතාට වක්‍රාකාරයෙන් සහය දුන් බවයි.**

පිළිතුර : ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීන්දුවක් ගත්තම මම ඒ තීන්දුවෙ හැම වෙලාම හිටපු කෙනෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෝඨාභය රාජපක්ෂ මහත්තයත් සමග ගිවිසුමක් අත්සන් කළා. ඊළඟට පොදුජන පෙරමුණත් එක්ක තව ගිවිසුමක් අත්සන් කරා.
ඒ ගිවිසුම් අත්සන් කළේ පක්ෂයේ ලේකම්වරුයි. එතකොට ඒ අවස්ථාවේදී මම බොහොම පැහැදිලිවම තීන්දු කළේ නිර්පාක්ෂික වෙන්නයි. ලංකාවේ පළවෙනි වතාවටයි රාජ්‍යනායකයෙක් නිර්පාක්ෂික වුණේ කියලා මැතිවරණ කොමිසමේ මහින්ද දේශප්‍රිය මහත්මයා කිව්වා. මැතිවරණ කොමිසම විසින් මෛත්‍රිපාල සිරිසේන මහත්මයාට සම්මානයක් දෙන්න ඕනේ කියලා එතුමා කියලා තිබ්බා. මම නිර්පාක්ෂික වීම තුළ තමයි ඇත්තටම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාත් නැතිව ගියේ. ලංකාවේ ජනාධිපති ඡන්දවලින් සාමකාමීම මැතිවරණය තමයි ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය කරපු මැතිවරණය. ඒකට හේතුව මම නිර්පාක්ෂික වීම. පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව මගේ අතේ තියාගෙන, මම යම්කිසි පාර්ශ්වයකට වැඩ කළා නම්, ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා ඒකෙන් ඉඩකඩ ලැබෙනවා. එහෙම වුණා නම්, මීට කලින් හිටපු අයට වගේම, බලය අනිසි ලෙස පාවිච්චි කිරීමේ චෝදනාව මටත් එනවා. 2015 දී ජනාධිපතිවරණයේදී මම මුහුණ දුන් අත්දැකීම් මොනවද කියලා කවුරුත් දන්නවා. එහෙම කිසිම ප්‍රශ්නයක් මෙවර ප්‍රධාන අපේක්ෂකයන් දෙන්නට හෝ වෙනත් අපේක්ෂකයෙකුට එල්ල වුණේ නැහැ. ඉතින් ඒක නිසා පැහැදිලි ලෙසම මම නිර්පාක්ෂික වීම මෙම මැතිවරණය සාමකාමී වීමට ප්‍රධානම කාරණය.

**ප්‍රශ්නය : ඔබගේ නිර්පාක්ෂික වීම සාධාරණ මැතිවරණයක් සඳහා හේතු වන්නට ඇති. එසේ වුවත් එහි දේශපාලන වාසිය හිමි වූයේ සජිත් ප්‍රේමදාස මහතාට නේද?**

පිළිතුර : ශ්‍රී.ල.නි.ප.ය, එ.ජ.නි.ස.ය විදියට ගත්ත තීන්දුවට අනුව මම වැඩ කළා. මගේ සංවිධායකවරු, රට වටේම අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, සීයට අනූ නවයක්ම වැඩ කළේ ගෝඨාභය රාජපක්ෂ මහතාට. මුස්ලිම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් පමණක් එහෙම වැඩ කළේ නැහැ. ශ්‍රී.ල.නි.ප.ය, එ.ජ.නි.ස.ය. යේ ඒ කැපවීම තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ජයග්‍රහණයට ප්‍රධානම හේතුව වුණේ.

2018 පළාත් පාලන ඡන්දේදි අපිට ලක්ෂ දාහතක් ලැබුණා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කරපු වැඩි ඡන්ද සංඛ්‍යාව ගත්තහම, අපි බොහොම පැහැදිලිවම පෙන්නුම් කරලා තියෙනවා අපේ සහයෝගය එතුමාගේ ජයග්‍රහණයට විශේෂ හේතුවක් වුණා කියලා.